**අධ්‍යාපන අංශය සංවර්ධනය කිරීමේ වැඩසටහන (ඊඑස්ඩීපී) - පළාත් මට්ටම - 2015**

--------------------------------------------------------------------------------------------

අධ්‍යාපන අංශය සංවර්ධනය කිරීමේ වැඩසටහන (ඊඑස්ඩීපී) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ආසියානු සංවර්ධන බැංකුව (ආසංබැ) අතර 2013 අගෝස්තු 19 දින එළඹි අංක 3008 එස්ආර්අයි සාමාන්‍ය මෙහෙයුම් හා අංක 3009 එස්ආර්අයි විශේෂ මෙහෙයුම් ගිවිසුම්වල iv ව්‍යවස්ථාවේ 4.04 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහන් කාලය**

--------------------------------------------------------------------------------------------

ණය ගිවිසුම් වලට අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය, විභාග දෙපාර්තමේන්තුව සහ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘතියේ ජාතික මට්ටමේ කාර්යයන් සිදුකිරීමට අපේක්ෂා කරන අතර පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සහ සියළුම පළාත් සභා වල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ විසින් පළාත් මට්ටමේ කාර්යයන් සිදුකිරීමට අපේක්ෂා කෙරේ. ණය ගිවිසුම් වලට අනුව, රටේ සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රය මුහුණ දෙන අභියෝග ඇමතීමට 2013-2017 අධ්‍යාපන ක්ෂේත්‍ර සංවර්ධන කාර්යය රාමුවක් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මූල්‍ය සහයෝගය ලබාදීම සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත. ද්විතීක පාසල් වල පිරිමි හා කාන්තා උපාධිධාරී සේවා නියුක්තිය ඉහල නංවන නවීන ද්විතීක පාසල් අධ්‍යාපන ක්‍රමයක් වැඩිදියුණු කිරීම වැඩසටහනේ අරමුණු වේ. ණය ගිවිසුම් වලට අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 26,000කට සමාන එජඩො මිලියන 200 ක් වේ. වැඩසටහනේ කාර්යයන් 2013 අගෝස්තු 23 ආරම්භ කරන ලද අතර 2018 අගෝස්තු 31 වන විට සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබේ. පළාත් සභා යටතේ ක්‍රියාත්මක වන පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ සහ දෙපාර්තුමේන්තු විසින් පළාත් මට්ටමින් සිදුකළ කාර්යයන් පිළිබඳ මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.3 ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

--------------------------------------------------------------------------------------------

පළාත් සභා වල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයන්හී විසර්ජන ගිණුම් සංග්‍රහ කිරීමෙන් මෙම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදී හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල

සාධාරණත්වය ඇගයීම මෙන්ම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද ප්‍රගති වාර්තා සහ වැඩි දියුණු කරන ලද මූල්‍ය වාර්තා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වියදම් සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ අරමුදල් සපයනු ලබන නියෝජිතායතනයන්ගෙන් ලද අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ පළාත් අධ්‍යාපන අංශයේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඊ) මුදල් රෙගුලාසි 150 සහ අදාළ පළාත් සභා ප්‍රධාන ලේකම්වරු විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කර තිබුණේ ද යන බව.

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(ඌ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1** **මතය**

**------**

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ ,

(අ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද පළාත් සභාවල 2015 වර්ෂයේ විසර්ජන ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 150 සහ අදාළ පළාත් සභා ප්‍රධාන ලේකම්වරු විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස් වල සඳහන් විධිවිධානවලට අනුකූල වන පරිදි පිළියෙල කර ඉදිරිපත් කර ඇත. ඉහත විසර්ජන ගිණුම් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්, වාර්ෂික අයවැය ඇස්තමේන්තු හා පළාත් සභා අධ්‍යාපන අමාත්‍යාංශ විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත්, ලේඛන හා වාර්තා සමඟ එකඟ වේ. 2015 වර්ෂය සඳහා ණය මුදල්

වලින් දරන ලද පිරිවැය පළාත් සභා අධ්‍යාපන අමාත්‍යාංශ විසර්ජන ගිණුම්වල නියමිත පරිදි වාර්තා කර තිබුණු බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඇ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂයේ අයවැයගත ප්‍රතිපාදන සහ සමාලෝචිත වර්ෂය තුල හා 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාළ වැදගත් සංඛ්‍යාලේඛන කීපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් කරන ලද වෙන්කිරීම් | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2015 වර්ෂය තුල | | 2015 දෙසැම්බර් 31 දක්වා | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසංබැ | 200 | 26,000 | 5,143 | 32 | 4,202.80 | 112 | 14,793.40 |
| | 200 | 26,000 | 5,143 | 32 | 4,202.80 | 112 | 14,793.40 |

### 3.2 භෞතික ප්‍රගතිය

මූල්‍ය ගිවිසුමේ උපලේඛන 03 හි ඇමුණුම් 01 අනුව, වියපැහැදම් කිරීම් සම්බන්ධ දර්ශක 33 යටතේ වියපැහැදම් කිරීම් සම්බන්ධ ප්‍රතිඵල 09 ක් ඉටුකර ගැනීමට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත. තවද, පළාත් සභා විසින් අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා සියලු අරමුදල් මූලාශ්‍ර වලින් 2015 දෙසැම්බර් 31 දිනට දරන ලද මුළු වියදම වූ රු. මිලියන 122,848 ක් නියෝජනය කරන ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ ලෙස විගණනයට ඉදිරිපත් කර තිබුණි. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු හා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවල මෙහෙයුම් වලට අදාළ 2015 වර්ෂයේ පළාත් සභා විසර්ජන ගිණුම් සම්බන්ධයෙන් කරන ලද ප්‍රධාන විගණන නිරීක්ෂණ කිහිපයක් පහත ආකාරයට නැවත ඉදිරිපත් කෙරේ.

(අ) විය පැහැදම් කිරීම පිළිබඳ දර්ශක 01 අනුව,2015 දෙසැම්බර් 31 වන විට අපොස සාමාන්‍ය පෙළ විභාගයේ පාසල් අයදුම්කරුවන්ගේ සමත් ප්‍රතිශතය සියයට 63 ක් විය යුතුය. ප්‍රගති වාර්තා අනුව, 2015 දෙසැම්බර් 31 වන විට අපොස සාමාන්‍ය පෙළ විභාගයේ පාසල් අයදුම්කරුවන්ගේ සමත් ප්‍රතිශතය සියයට 69.33 ක් ලෙස පැවතුණි. කෙසේවුවද, යාපනය, නුවරඑළිය, ත්‍රිකුණාමලය, මුලතිව් සහ කිලිනොච්චි යන දිස්ත්‍රික්කවල 2015 වර්ෂයේ අපොස සාමාන්‍ය පෙළ විභාගයේ පාසල් අයදුම්කරුවන්ගේ සමත් ප්‍රතිශතය සියයට 63 ට වඩා පහළ

මට්ටමක පැවතුණි. අපොස සාමාන්‍ය පෙළ විභාගයේ සියළුම විෂයයන් අසමත් වූ පාසල් අයදුම්කරුවන්ගේ සාමාන්‍ය ප්‍රතිශතය සියයට 3.18 ක් ලෙස පැවති අතර ග්‍රාමීය දිස්ත්‍රික්කවල එය ඉතා ඉහළ අගයක් ගෙන තිබුණි. එම නිසා අපොස සාමාන්‍ය පෙළ විභාගයේ සියළුම විෂයයන් අසමත් වීමේ අනුපාතය කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සියයට 8.64 ක්, මොණරාගල දිස්ත්‍රික්කයේ සියයට 5.56 ක්, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියයට 5.46 ක්, යාපනය දිස්ත්‍රික්කයේ සියයට 4.96 ක් සහ මුලතිව් දිස්ත්‍රික්කයේ සියයට 4.82 ක් ලෙස වාර්තා විය.

(ආ) විය පැහැදම් කිරීම පිළිබඳ දර්ශක 02 අනුව,2015 දෙසැම්බර් 31 වන විට අපොස උසස් පෙළ විභාගයේ පාසල් අයදුම්කරුවන්ගේ සමත් ප්‍රතිශතය සියයට 63.5 ක් ළඟා කර ගත යුතු විය. කෙසේ වුවද, ප්‍රගති වාර්තා අනුව, 2015 දෙසැම්බර් 31 වන විට අපොස උසස් පෙළ විභාගයේ පාසල් අයදුම්කරුවන්ගේ සමත් ප්‍රතිශතය සියයට 62.35 ක් ලෙස පැවතුණි. අපොස උසස් පෙළ විභාගයේ සියළුම විෂයයන් අසමත් වූ පාසල් අයදුම්කරුවන් සියයට 8.64 ක් වූ අතර සියයට 9.89 ක් සහ සියයට 9.64 ක සියළුම විෂයයන් අසමත් වීමේ ඉහළ ප්‍රතිශතයක් පිළිවෙළින් දකුණු සහ උතුරුමැද පළාත්වලින් වාර්තා වී තිබුණි.

(ඇ) සිසුන් සහ දෙමාපියන් වෙනුවෙන් උපදේශාත්මක සහ අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම හරහා තාක්ෂණික විෂය ධාරාවේ අධ්‍යයන කටයුතු ප්‍රචලිත කිරීමට අපේක්ෂා කර තිබුණි.කෙසේ වුවද, අපොස උසස් පෙළ තාක්ෂණ විෂය ධාරාවට පසුගිය වර්ෂයේ ඇතුළත් වී තිබූ සිසුන් 15,747 කට සාපේක්ෂව සිසුන් 12,102 ක් පංතිවලට ඇතුළත් වී තිබුණි.සවිස්තරාත්මක විගණනය අනුව, 2015 වර්ෂයේදී උතුරු පළාතේ තාක්ෂණ විෂය ධාරාවේ ශිෂ්‍ය ජනගහණය සියයට 11.45 කින්ද, දකුණු පළාතේ සියයට 4.25 කින්ද පහත වැටී ඇති බව අනාවරණය විය.තවද, බස්නාහිර පළාතේ පාසල් 34 ක සහ මධ්‍යම පළාතේ පාසල් 18 ක තාක්ෂණ විද්‍යාගාරවලට අවශ්‍ය පහසුකම් නොමැතිව තාක්ෂණ විෂය ධාරාව සඳහා නව පංති ආරම්භ කර තිබුණි.තවද, ඌව, උතුර, මධ්‍යම, දකුණ, සබරගමුව සහ වයඹ යන පළාත්වල පළාත් පාසල් 52 ක තාක්ෂණික විද්‍යාගාර නොමැතිව තාක්ෂණ විෂය ධාරාව සඳහා පංති ආරම්භ කර තිබුණි. සුදුසුකම් ලත් ගුරුවරුන්ගේ හිඟයක් පැවතියදී මධ්‍යම පළාතේ පළාත් පාසල් 18 ක තාක්ෂණ විෂය ධාරාව සඳහා පංති පවත්වාගෙන යන බව අනාවරණය විය.

(ඈ) 1C ශ්‍රේණියේ පවතින පළාත් පාසල් 225 ක් 1AB ශ්‍රේණියේ මට්ටමට වැඩි දියුණු කිරීමට ක්‍රියා මාර්ග ගෙන තිබුණද,2015 දෙසැම්බර් 31 වන විට පළාත් පාසල් 125 ක් පමණක් වැඩි දියුණු කිරීමේ අරමුණෙන් සංවර්ධන කාර්යයන් අවසන් කර තිබුණි. 1AB ශ්‍රේණියට වැඩි දියුණු කරන ලද මධ්‍යම පළාතේ පාසල් 17 ක සිදු කරන ලද පරීක්ෂාවකින් පාසල් 03 ක එනම්,උඩුදුම්බර ද්විතියික පාසල,දුන්හින්න ඉසුරු විද්‍යාලය සහ පන්විල රාජකීය පාසල යන පාසල්වල විද්‍යා විෂය ධාරාව සඳහා ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාව පංතිවලට ඇතුළත් වී නොමැති බව අනාවරණය විය.

(ඉ) විද්‍යා විෂය ධාරාව සඳහා 2013 සහ 2014 වර්ෂවල අලුතින් බඳවා ගත් ගුරුවරුන් මධ්‍යම පළාතේ පාසල්වලට අනුයුක්ත කර තිබුණද, 2015 වර්ෂයේදී සේවාස්ථ සැසි පවත්වා නොතිබූ අතර ඒ සඳහා රු.මිලියන 2.78 ක් වෙන් කර පැවති බව නිරීක්ෂණය විය.

(ඊ) අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලබා ගත හැකි වූ තොරතුරු අනුව ,2015 දෙසැම්බර් 31 වන විට දිවයින පුරා පාසල් 107 ක් වසා දමා තිබුණි.කෙසේ වුවද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවලින් රැස් කර ගත් සංඛ්‍යා දත්ත අනුව ,පාසල් 389 ක් වසා දමා තිබුණි.රේඛීය අමාත්‍යාංශයේ මෙන්ම පළාත් අමාත්‍යාංශවලද තොරතුරු හුවමාරු කර ගැනීමේ ඵලදායී ප්‍රතිපත්තියක් ස්ථාපිත කර නොමැති බව සහ විධිමත් අධීක්ෂණ ක්‍රියාවලියක් නොමැති බව එයින් දක්වනු ලැබේ.

(උ) පළාත් මට්ටමේ පාසල් සඳහා ගුරුවරුන් වෙන්කිරීම සතුටුදායක ලෙස සිදු කර නොතිබුණි. රැස්කරගත් තොරතුරු අනුව, උතුර, උතුරුමැද, වයඹ, සබරගමුව, ඌව සහ බස්නාහිර යන පළාත්වල ග්‍රාමීය පාසල්වල ප්‍රධාන විෂයයන් සඳහා ගුරු හිඟයක් පැවතියද අදාළ පළාත්වල නාගරික පාසල්වල ගුරු අතිරික්තයක් පැවතුණි. තවද, වාර්ෂික ස්ථාන මාරු ක්‍රමය විධිමත්ව ක්‍රියාත්මක නොවන බව සහ එහි ප්‍රතිඵලයක් ලෙස උතුර, උතුරුමැද, ඌව සහ වයඹ යන පළාත්වල විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් වසර 10 ක් පුරා එම පාසල්වලම රැඳී තිබුණි. ඊට අමතරව සබරගමුව සහ වයඹ පළාත්වල ගුරුවරුන් ඌන උපයෝජිත බව සවිස්තරාත්මක විගණනයේදී නිරීක්ෂණය විය.